ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2016-08-16 |
|---|---|---|---|

පැමිණිලිකාරිය : එම්.ඩී.එස්. රංජනී මිය.
නො : 03, නඳුන් උයන,
මත්තේගොඩ.

වගඋත්තරකරුවන් : 01. ගණකාධිකාරි,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
පානළුව, පාදුක්ක.

02. මානව සම්පත් කළමණාකරු,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
පානළුව, පාදුක්ක.

<u>පැමිණිලි අංකය : HRC/4743/14</u>

**පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති කරුණු කෙටියෙන් :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ සේවක මහත්ම මහත්මීන්ට නිවාස ණය පහසුකම් ලබාදීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අනුග්‍රහයෙන් ණය යෝජනා ක්‍රමයක් ඇති කළ බවත් ඊට අදාළ චක්‍රලේඛය අනුව තමා ද ණය මුදලක් ලබාගත් බවත්ය. චක්‍රලේඛන 95/2 අනුව රජයේ අනුමත සහනදායි පොලී අනුපාතය වන 7.2% පමණක් අදාළ සේවකයන්ගෙන් අඩුකර ගැනීමටත් ඉතිරි පොලී ප්‍රමාණය හෙවත් වෙනස සංස්ථාව විසින් ප්‍රතිපූර්ණය කරන බවට දන්වා ඇති බවත් සඳහන් කර ඇත. එසේ තිබියදී පැමිණිලිකාරියගේ ණය පොලී අඩුකිරීමේදී 9.2% ප්‍රමාණයක් පැමිණිලිකාරියගෙන් අඩුකර ඇති බවත් එය නිවැරදි කර තමාගෙන් වැඩිපුර අයකර ඇති 2%ක ප්‍රමාණය නැවත තමාට ලබාදෙන ලෙසට පැමිණිලිකාරිය වගඋත්තරකරුවන්ගෙන් ඉල්ලා සිටි බවත් නමුත් එම නිවැරදි කිරීම වගඋත්තරකරුවන් විසින් සිදුකර නොමැති බැවින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165,කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

මීට අමතරව පැමිණිලිකාරිය විසින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් ලබාගත් ණය මුදලේ වාරිකය සහ පොලිය වැටුපෙන් අඩුකර බැංකුව වෙත යැවීමට ආයතනයට දැනුම්දුන්නද එසේ සිදුකර නොමැති බවත් පැමිණිලිකාරිය දන්වා ඇත.

වගඋත්තකරුවන් විසින් තමාගේ වැටුපෙන් ණය මුදල කපා බැංකුව වෙත යැවීමට ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කළ ද එය අසත්‍යයක් බවත් 95/2 චක්‍රලේඛයේ 6 iv වගන්තිය අනුව "මෙම ණය මුදල ලබාදීමේදී සේවකයාගේ වැටුපෙන් අඩුකිරීම 40% සීමාව සඳහා සැලකිල්ලට නොගනු ඇත" යනුවෙන් දන්වා ඇති බවත් වැඩිදුරටත් පෙන්වා දී ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

2015.07.27 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී, උකස් හා ආයෝජන බැංකුවෙන් ලබාගත් ණය මුදල වන රු. 170,000/- ක මුදලේ වාරිකය වෙනස්වීම මත 2% ක ප්‍රතිශතයේ වාසිය පැමිණිලිකාරියට පමණක් ලබා නොදී අනෙකුත් සේවකයන්ට ලබාදීම සම්බන්ධයෙන් පාලන අංශය වෙනුවෙන් පෙනී සිටි නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ එය නිවැරදි කරන ලෙසත් ගණකාධිකාරී වෙත ලිඛිතව 2013.07.01 දින කළමණාකරු පාලන හා මානව සම්පත්ගේ අත්සනින් යුතුව නියෝජ්‍ය මුදල් කළමණාකරු වෙත යවා ඇති බවයි.

මේ සම්බන්ධයෙන් 01 වන වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියට ගෙවිය යුතු පොලී ප්‍රතිශතය පිළිබඳව වැරදීමක් සිදුවී තිබේනම් එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිවැරදිකර ඉදිරිපත් කළයුතු බවයි. එමෙන්ම පැමිණිලිකාරියගේ ණය වාරික අඩුකර බැංකුව වෙත යැවීමට ප්‍රමාණවත් වැටුපක් පැමිණිලිකාරියට නොමැති බවද ප්‍රකාශ කර ඇත.

මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2015.07.27 වන දින පැවති පරීක්ෂණයේදී මෙම ණය වාරිකවල 2% වැඩිපුර අයකරගෙන ඇති මුදල පැමිණිලිකාරියට මෙතෙක් ගෙවා නොමැති නම් ඒ පිළිබඳ පරීක්ෂාකර චක්‍රලේඛ අනුව පැමිණිලිකාරියට හිමිවිය යුතු අයිතිවාසිකම් ලබාදීමට කටයුතු කර මාස 02ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 01 වන වගඋත්තරකරු දන්වා ඇති නමුත් ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකාරිය විසින් 95/2 ආයතන චක්‍රලේඛය අනුව ලබාගෙන ඇති ණය මුදලේ වාරික අඩු කිරීමට ප්‍රමාණවත් වැටුපක් නොමැති බැවින් එම ණය වාරිකය හා පොලිය වැටුපෙන් අඩුකර

නොමැති බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත. නමුත් පරීක්ෂණ දිනයේදී පැමිණිලිකාරියට අදාළ ණය වාරිකය ගෙවීමට ප්‍රමාණවත් වැටුපක් ඇති බව වගඋත්තරකරුවන්ට පෙන්වා දී ඇත. එමෙන්ම 95/2 චක්‍රලේඛය 6 iv අනුව "මෙම ණය මුදල ලබා ගැනීමේදී සේවකයන්ගේ වැටුපෙන් අඩු කිරීම් 40% සීමාව මේ සඳහා සැලකිල්ලට නොගනු ඇත" යනුවෙන් දක්වා ඇති බැවින් එම ණය වාරික වැටුපෙන් අඩු කර බැංකුව වෙත යැවීමට පියවර නොගැනීම හා ආයතනයේ අනෙකුත් සේවකයන්ට එසේ වැටුපෙන් අඩුකර යැවීම කරන බව වගඋත්තරකරුවන් පිළිගැනීම මත වගඋත්තරකරුවන් පැමිණිලිකාරියට වෙනස් කොට සැලකීමක් සිදුකරන බව ඉදිරිපත් වී ඇති කරුණු අනුව නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් පැමිණිලිකාරියට වෙනස්කොට සැලකීමක් සිදුකර ඇති බව පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ. එසේම මෙවැනි පරිපාලනමය අසාධාරණකම් පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස් (Ombudsman) කාර්යාලයට යොමු විය යුතුව තිබිණ.

නිර්දේශය :-

01. ආයතනයේ අනෙකුත් සේවකයන් හා සමානව 95/2 ආයතන චක්‍රලේඛය (4) අනුව පැමිණිලිකාරිය විසින් උකස් හා ආයෝජන බැංකුවෙන් ලබාගෙන ඇති ණය මුදලේ වාරික හා පොළී මුදල් පැමිණිලිකාරියගේ වැටුපෙන් අඩුකර උකස් හා ආයෝජන බැංකුව වෙත ගෙවීමට පියවර ගැනීමටත්,

02. පැමිණිලිකාරිය සේවය කරන ආයතනයේ අනකුත් සේවකයන් හා සමානව පැමිණිලිකාරියටද උකස් හා ආයෝජන බැංකුවෙන් ලබාගෙන ඇති ණය මුදල සඳහා 95/2 ආයතන චක්‍රලේඛයේ (2) අනුව 7.2% ක පොළිය පමණක් අඩුකර ගැනීමටත් වැටුපෙන් වැඩිපුර අයකර ඇති 2% ක පොළී ප්‍රමාණය නැවත පැමිණිලිකාරිය වෙත ගෙවීමට පියවර ගැනීමටත්,

03. ආයතනයේ පවතින නිතිරීති ක්‍රියාත්මක කිරීමේදී වෙනස් කමකින් තොරව හිමිකම් ලබන සියල්ලටම සමාන අවස්ථා ලබාදීමට පියවර ගැනීමටත් වගඋත්තරකරුවන් විසින් කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.07.[illegible] දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/labi

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka